C
374
RAT

අ:පො:ස: (උ:පෙ:) සිසුන්ගේ අධ්‍යාපනික අභිලාෂයන්
පිළිබඳ ව පර්යේෂණාත්මක විමර්ශණයක්
( මහනුවර අධ්‍යාපන දිස්ත්‍රික්කය ආශ්‍රිතව)

# AN EXPERIMENTAL INVESTIGATION OF EDUCATIONAL ASPIRATIONS OF G.C.E(A.L) STUDENTS
(IN RELATION TO KANDY EDUCATIONAL DISTRICT )

පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි ශාස්ත්‍රපති උපාධි
(අධ්‍යාපන විද්‍යා) සම්බන්ධයෙන් අවශ්‍යතා අර්ධ
වශයෙන් පුරණය කිරීම සඳහා ඉදිරිපත් කරන

පර්යේෂණාත්මක නිබන්ධනය - (1990/1991)

<u>නිබන්ධන උපදේශක:</u>

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

මහාචාර්ය එස්.ජේ.පෙරේරා මහත්මා.

එම්.පී. රත්නකුමාර,
ශාස්ත්‍රවේදී උපාධි (පේරාදෙණිය)
අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)
පේරාදෙණිය.

453176

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

## <u>සාරාංශය</u>

දොළහ සහ දහතුන යන වසරවල හෙවත් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පංතීන් හි ඉගෙනුම ලබන සිසුන්ගේ විවිධාකාර අභිලාෂවල සාපේක්ෂ ජනප්‍රියතාවය විමසා බැලීම සඳහා මෙම අධ්‍යයනය සිදු කෙරුණි.

අධ්‍යයනයෙහි නියැදිය වශයෙන් අ:පො:ස: (උ:පෙ:) පංතිවල ශිෂ්‍ය/ශිෂ්‍යාවන් අටසිය අනූ දෙකක් ( n = 892 ) යොදා ගනු ලැබී ය. ඔවුන්, විවිධ සමාජ මට්ටම් සහ ග්‍රාමීය/නාගරික තත්වයන් නියෝජනය වන ලෙස මහනුවර අධ්‍යාපන දිස්ත්‍රික්කයෙන් තෝරා ගන්නා ලදි. පිරිමි/ගැහැණු සහ කලා/විද්‍යා/වාණිජ යන විවිධත්වයන් ද නියැදිය තෝරා ගැනීමේ දී සැළකිල්ලට භාජනය විය.

නියමු පරීක්ෂණ දෙකකින් හඳුනාගත් අභිලාෂයන් විස්සක් (20) එම නියැදිය වෙත යොමු කෙරුණි. එකිනෙක අභිලාෂයට ඇති ජනප්‍රියතාවය විමසා බැලීම පිණිස යුගල් සංසන්දන ක්‍රමය ( paired comparison method ) භාවිතය විය. අභිලාෂ සැසඳීමේ කාර්යය පිණිස එක් ශිෂ්‍යයෙකු එක් ත්‍රිකෝණාකාර කොටුදැල් ජාලයක් ( grid ) බැගින් පාවිච්චි කරනු ලැබී ය.

ඒ ඒ ශිෂ්‍යයා, සළකන ලද අභිලාෂයන්ට දක්වන ලද ප්‍රතිචාරයන්ට ලකුණු පවරන ලද අතර, එම ලකුණු සංඛ්‍යාන විද්‍යාත්මක විශ්ලේෂණයට භාජනය විය. මුල්න් ම මුළු නියැදිය ( 892 ) ආශ්‍රිත ව අභිලාෂවල ජනප්‍රියතාවය විමර්ශණය කෙරුණි.

ඉන් පසුව අභිලාෂ : පිරිමි/ගැහැණු, ග්‍රාමීය/නාගරික යන විචල්‍යයන් ආශ්‍රයෙන් විමසන ලදි. ඒ හැර කලා/විද්‍යා/වාණිජ සිසුන් අතර අභිලාෂයන්හි

වෙනස්කම් පිළිබඳ විමර්ශණයෙන් පසු අවසාන වශයෙන් අභිලාෂ, සාධනයට දක්වන සම්බන්ධතාවය පිළිබඳ ව ද විමසනු ලැබී ය.

මෙවැනි විමර්ශණයන්හි ප්‍රතිඵල කෙටියෙන් පහත දැක්වේ :

1. <u>අභිලාෂවල ජනප්‍රියතාවය:</u>

* ජනප්‍රියතාවය අනුව අභිලාෂ පෙළ ගැස්වූ විට; විශ්වවිද්‍යාල පිවිසීම, විෂය දැනුම ලැබීම, විෂය බාහිර දැනුම ලැබීම.. නිෂ්පාදන ශිල්පීය ක්‍රම පුහුණුව, ක්‍රීඩා කුශලතාවය, විදේශගත වීම යනාදී පිළිවෙලට පිහිටයි. සියළුම අභිලාෂ ඇත්තවශයෙන්ම ශාස්ත්‍රීය, සදාචාරාත්මක, වෘත්තීය සහ තාක්‍ෂණික යන ප්‍රවර්ග හතරකට (4) බෙදීමට පුළුවන් විය.

2. <u>පිරිමි/ගැහැණු වෙනස්කම්:</u>

* පිරිමි/ගැහැණු වෙනස නොසලකා අදාළ සිසුන්ගේ අධ්‍යාපනික අභිලාෂයන්හි විශාල සමානත්වයක් පවතී. එකී සමානත්වය ශාස්ත්‍රීය සහ සදාචාරාත්මක යන අභිලාෂ ප්‍රවර්ග හරහා ගමන් කරයි.

* උ:පෙ: පිරිමි ළමයි, එම ගැහැණු ළමයින්ට වඩා තාක්‍ෂණික අභිලාෂයන්ට නැඹුරු වෙති.

3. <u>ග්‍රාමීය/නාගරික වෙනස්කම්:</u>

* ග්‍රාමීය/නාගරික සියළු සිසුහු, සදාචාරාත්මක අභිලාෂයන්ට සමාන අභිනතියක් දක්වති.

UNIVERSITY OF PERADENIYA
8-7-1994
LIBRARY

* ග්‍රාමීය ප්‍රදේශයන්හි අ:පො:ස: (උ:පෙ:) සිසුහු, එම නාගරික සිසුනට සාපේක්ෂ ව ශාස්ත්‍රීය සහ තාක්ෂණික අභිලාෂයන්ට වැඩි නැඹුරුවක් දක්වති.

* නාගරික ප්‍රදේශයන්හි උ:පෙ: සිසුහු, එම ග්‍රාමීය සිසුනට වඩා වෘත්තීය අභිලාෂයන්ට ප්‍රමුඛත්වය ප්‍රදානය කරති.

4. <u>කලා/විද්‍යා/වාණිජ වෙනස්කම්:</u>

* කලා/විද්‍යා/වාණිජ යන සිසුන් අතර, ශාස්ත්‍රීය/ සදාචාරාත්මක සහ වෘත්තීය අභිලාෂයන් කෙරෙහි සමාන අභිනතියක් පවතී.

* විද්‍යා විෂය ධාරාව හදාරණ උ:පෙ: සිසුහු ( කලා විෂය ධාරාව හදාරන්නන්ට සාපේක්ෂ ව ) වෘත්තීය අභිලාෂයන්ට ඉහළ නැඹුරුවක් දක්වති.

* වාණිජ විෂය ධාරාව හදාරණ සිසුහු ( කලා විෂය ධාරාව හදාරන්නන්ට සාපේක්ෂ ව ) තාක්ෂණික අංශයට නැඹුරු වෙති. විද්‍යා විෂය ධාරාව හදාරණ සිසුහු ( වාණිජ විෂය ධාරාව හදාරන්නන්ට සාපේක්ෂ ව ) තාක්ෂණික අංශයට නැඹුරු වෙති. ඒ අනුව කලා විෂය ධාරාවෙහි සිසුන් තුළ අවම ප්‍රමාණයෙන් ද, විද්‍යා විෂය ධාරාවෙහි සිසුන් තුළ උපරිම ප්‍රමාණයෙන් ද තාක්ෂණික අභිලාෂයන් පවතී.

5. <u>අභිලාෂ සහ සාධනය අතර සම්බන්ධතාවය:</u>

* සාධනයෙහි අඩු/වැඩි වෙනස නොසලකා ශාස්ත්‍රීය සහ සදාචාරාත්මක අභිලාෂයන්ට සිසුහු සමාන නැඹුරුවක් දක්වති.

* අඩු සාධන මට්ටමක් සහිත සිසුහු, සාධනය ඉහළ සිසුන් ද අභිබවා වෘත්තිය අභිලාෂයන්ට නැඹුරු වෙති.

* සාධන මට්ටම ඉහළ සිසුහු, සාධනය අඩු සිසුන්ට වඩා තාක්ෂණික අභිලාෂයන්ට වැඩි අභිනතියක් දක්වති.

මූල නියැදිය සහ උපනියැදි හතරක් (4) ආශ්‍රිත ව ඉහත ප්‍රතිඵල ලද අතර, එකී උප නියදීන් තවත් සුවිශේෂී ව විමර්ශණය කිරීමෙන් තවත් අතුරු ප්‍රතිඵල රාශියක් ලැබුණි.

ඉහත සඳහන් ලෙස ලබා ගත් ප්‍රතිඵල සමහර අවස්ථාවල දී මීට පෙර කරන ලද පර්යේෂණ ප්‍රතිඵල සනාථ කරයි.

උදාහරණයක් වශයෙන් සඳහන් කරන්නේ නම් මෙම අධ්‍යයනයේ දී සොයා ගත් විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ අභිලාෂය, පෙර අධ්‍යයනවල දී ( Perera, 1986 ) මෙන් දැඩි ව පවතින බව පෙනී ගියේ ය. මෙහ අපේක්ෂා කළ ප්‍රතිඵලයකි. සමහර ප්‍රතිඵල, මීට පෙර කරන ලද පර්යේෂණ ප්‍රතිඵලවලට පටහැනි විය. අභිලාෂ අතින් නාගරික/ ගම්බද සේ සොයා ගත් වෙනස්කම් වන ග්‍රාමීය සිසුන් තුළ පවත්නා දැඩි ශාස්ත්‍රීය සහ තාක්ෂණික නැඹුරු ව නෙල්සන් ( Nelson , 1971 ) ගේ අධ්‍යයනයෙහි නොපැවතීම එයට උදාහරණ වෙයි. අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලද නියැදි මදකෙහි පැවතිය හැකි සංස්කෘතික, සමාජයීය වැනි වෙනස්කම් මෙවැනි පටහැනි ප්‍රතිඵලයන්ට පදනම් වූවා විය හැකි ය.

අවසාන වශයෙන් පර්යේෂණයෙහි ප්‍රතිඵල සමස්තයක් ලෙස සළකන කල විශ්වවිද්‍යාල පිවිසීම පෙරටු කොටගත්, ශාස්ත්‍රීය අභිලාෂ ඔස්සේ ගමන් කරන ශිෂ්‍ය රැල්ලක් අ: පො: ස: (උ: පෙ:) පංතිවල දැකිය හැකි යැයි පර්යේෂකයා සාකච්ඡා කොට ඇත. මෙය අවධානයට යොමු කරමින් සුදුසු පූර්වාදර්ශ සිසුනට ලබා දීමත්, සුදුසු සැළසුම් කිරීමත් අධ්‍යාපනික සංවර්ධනයට පාදක විය හැකි බවට ඔහු අදහස් ඉදිරිපත් කර ඇත.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY